විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2009 දිනය / திகதி / Date 2009- 01- 07

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1 /2009

දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම - ප්‍රතිසංශෝධනය

1981 අංක 44 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සංශෝධන පනතෙහි සහ 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතෙහි විධිවිධානයන්ට අනුව ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමට නීතිමය ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද වෛද්‍ය නිළධාරීන් තිදෙනකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් විසින් අනත්දරුවකුට ඔහුගේ ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නාවූ ශාරීරික හෝ මානසික අශක්තතාවයකින් පෙළෙන බවට තීරණය කල විට ඒ අනත්දරුවාට වයස නොතකා යාවජීව විශ්‍රාම වැටුපක් ලැබීමට ප්‍රතිපාදන සලසා ඇත.

රාජ්‍ය නිලධාරී/ නිලධාරිනියන්ගේ ඇවෑමෙන් පසු ඔවුන්ගේ ආබාධිත අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය තුල මේ වන විට විවිධ ගැටළු පැන නැගී ඇත.

1. දැනට පවතින ගැටළු :-

1.1 රාජ්‍ය නිලධාරීන්ගේ ආබාධිත අනත්දරුවන් 23000 ක් පමණ මේවන විට/ ආබාධිත වැටුප් ලබා ගැනීම හා දිනපතා ලැබෙන ඉල්ලුම් ප්‍රමාණය ඉහල යාම.

1.2 ආරම්භක අවස්ථාවේදී සිදුකල වෛද්‍ය මණ්ඩල පරීක්ෂණය හැර යලිත් වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් නොකිරීම.

1.2 ආබාධිත අනත්දරුවන් විවාහ වීම/ වෙනම පවුල් ඒකක වශයෙන් ජීවත්වීම, රැකියා ලැබීම, ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වල නියුක්ත වීම, ආදායම් මාර්ග පැවතීම විවිධ විෂය ක්‍රියාකාරකම් වල නියැලීම යන අවස්ථා නොසලකා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අඛණ්ඩව ගෙවීම.

1.4 භාරකරුවන් වෙත විශ්‍රාම වැටුප ගෙවීම හේතුවෙන් ආබාධිත දරුවාට විශ්‍රාම වැටුප නිසි පරිදි නොලැබීම, නොසළකා හැරීම, නිවාස ගත කිරීම, රෝහල් ගත කිරීම, භාර කරුවන්ගේ නිසි රැකවරණය නොලැබීම හා භාරකරු මෙම විශ්‍රාම වැටුපෙන් යැපීම වැනි හේතුන් පිළිබඳව අවධානය යොමු නොවීම.

| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

1.5 මූලික පරීක්ෂණ අවස්ථාවේදී, රෝගී තත්ත්වය හා ආබාධිත තත්ත්වය මෙන්ම සුජාත දරුවකු බව තහවුරු කර නොගැනීම.

1.6 පසුවිපරමක් සිදු නොවීම හේතුවෙන් ආබාධිත දරුවන් හා ඔවුන්ගේ රැකවරණය පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදු නොවීම හා ආබාධිත දරුවා මියගිය පසුවද භාරකරු විශ්‍රාම වැටුප දිගටම ලබාගැනීම.

1.7 ආබාධිත තත්වයට ලක් නොවූ එහෙත් පසුකාලයකදී විවිධ රෝගාබාධ වලට ලක්වීම, වයස්ගත වීම නිසා රෝගාබාධ වලට ඇතුලත් වීම වැනි හේතු මත ආබාධිත විශ්‍රාම වැටුප ලබා ගැනීමට ඉල්ලුම් කිරීම විශාල වශයෙන් වැඩි වීම.

1.8 වයස අවු : 26 ඉක්මවූ අවිවාහක කාන්තාවන් තම අවිවාහකත්වය මත ඉහත විශ්‍රාම වැටුප හිමිවේය යනුවෙන් සිතා විවිධ ඉල්ලීම් ඉදිරිපත් කිරීම.

1. 9 බොහෝ ගෙවීම් ලිපිගොනු නොමැතිව සිදුකෙරෙන අවස්ථා අනාවරණය වීම.

2. **මෙම ගැටළු සහගත තත්ත්වය හේතුවෙන් පහත සඳහන් ප්‍රතිපත්තිමය තීරණ ගෙන තිබේ.**

2.1 සැබෑ වශයෙන් පූර්ණ ආබාධිත දරුවන්ට පමණක් ප්‍රතිලාභ හිමිවන පරිදි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත් සංශෝධනය කිරීම.

2.2 නව ආබාධිත අනත්දරුවන්ට විශ්‍රාම වැටුප ගෙවීමේදී අනුගමනය කෙරෙන ක්‍රියාවලිය සංශෝධනය කිරීම.

2.3 දැනට ගෙවනු ලබන ආබාධිත විශ්‍රාම වැටුප් පිළිබඳව අධ්‍යයනයක් සිදුකිරීම හා ගෙවීම් ප්‍රතිසංශෝධනය කිරීම.

3. දෙමාපියන් අහිමි වීම නිසා තම ජීවනෝපාය සලසා ගත නොහැකි හා නිසි රැකවරණය නැති පූර්ණ ආබාධිත දරුවන්ට වැඩිප්‍රතිලාභ හිමිවන පරිදි වැන්දඹු වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත් සංශෝධනය සඳහා යථා කාලයේ පියවර ගනු ලැබේ. එමෙන්ම මින් ඉදිරියට ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අනුමත කර ගෙවීමේ ක්‍රියාවලිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

3.1 නව ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත ඉදිරිපත් කල යුත්තේ ආබාධිත දරුවා පදිංචි කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් වෙතය. මේ සඳහා *අබා 01* ආකෘතිපත්‍රය උපයෝගි කර ගත යුතුය. මින් ඉදිරියට දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ඉල්ලීම්ද අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත හරවා එවනු ලැබේ.

3.2 මූලික ඉල්ලීම හෝ අයදුම්පත ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් වූ පසු හිමිකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කොට ඒ බව හේතු සහිතව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව අයදුම්කරුට දන්වා යැවිය යුතුය. අයදුම්පත් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි දැඩි අවධානය යොමු කල යුතුය.

3.2.1 අයදුම්පත් පරීක්ෂා කිරීමේදී රෝගාබාධය හා නිත්‍යාබාධය යන්න පළමුවෙන්ම හඳුනාගත යුතුය.

3.2.2 වයස්ගත වීම මත සිදුවන රෝගාබාධ සඳහා ගෙවීම් කල නොහැකි බව දන්වා යැවිය යුතුය.

3.2.3 වයස අවු : 26 ඉක්මවන ලද ආබාධිත නොවන අවිවාහක කාන්තාවන්ගේ ඉල්ලීම්ද ප්‍රත්ක්ෂේප කල යුතුවේ.

3.2.4 ආදායම් ඉපයීමට නොහැකි වන සහ නිත්‍යාබාධිත ද යන්න හඳුනා ගත යුතුය.

3.2.5 භාරකරුවකු අවශ්‍ය නොවේ නම් ඊට හේතු සොයා බැලීම.

3.2.6 භාරකරුගේ රැකවරණය යටතේ ආබාධිතයා පදිංචි වී සිටින බවට තහවුරුවක් ගැනීම.

3.3 අදාල අයදුම්පත ලැබුන පසු එය විශ්‍රාම වැටුප්/ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනු සමග ඒකාබද්ධ කල යුතුය.

3.4 ආබාධිත දරුවා / භාරකරු වෙනත් ඥාතීන් හා ග්‍රාම නිලධාරි සහභාගී කරගෙන පරීක්ෂණයක් පැවැත්විය යුතුය. එම පරීක්ෂණයට අනුව පරීක්ෂණ වාර්තාවක් සකස්කල යුතු අතර ඒ සඳහා *අබා 02* ආදර්ශ පරීක්ෂණ වාර්තා අකෘතිය යොදාගත යුතුවේ.

මෙම පරීක්ෂණය සහකාර ප්‍රදේශීය ලේකම්/ ගණකාධිකාරි/ පරිපාලන නිලධාරි/ විශ්‍රාම වැටුප් නිලධාරි (අවම වශයෙන් නිලධාරි දෙදෙනකු) විසින් සිදුකල හැක. පරීක්ෂණ වාර්තාවේ නිරීක්ෂණ මත ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ලබාදිය යුතුය.

4. ඉහත නිර්දේශය සමග සම්පූර්ණ ලිපිගොනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් (වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශය) වෙත යොමුකල යුතුය.

5. වෛද්‍ය මණ්ඩල වෙත යොමු කිරීම ඔබගේ නිර්දේශය මත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු බැවින් නිර්දේශය පැහැදිලිව ඉදිරිපත් කළ යුතුය.

6. අනුමත කල විශ්‍රාම වැටුප් ලිපිගොනුව ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවීම් සඳහා යොමු කරනු ලැබේ. අදාල ප්‍රදානය ග්‍රාම නිලධාරි මගින් ආබාධිත පුද්ගලයාට / භාරකරුට නිකුත් කල යුතුය. භාරකරු නිර්දේශයේදී, ආබාධිතයා පදිංචි ස්ථානයේම භාරකරු පදිංචි වී සිටින බවට තහවුරු කර ගත යුතුය.

7. ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම හැකිතාක් දුරට තැපැල් කාර්යාල වලට සීමා කල යුතුය. භාරකරුවකු වෙත ගෙවීම සිදුකිරීමේදී හැඳුනුම්පතෙහි ආබාධිත දරුවාගේ හා භාරකරුවාගේ ඡායාරූප දෙකම ඇලවිය යුතුය.

8. ආබාධිත දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු අධීක්ෂණය පූර්ණ වශයෙන්ම ග්‍රාම නිලධාරීන්ට පැවරිය යුතුය. නිසි රැකවරණය සැලසෙන බවට ග්‍රාම නිලධාරී වග බලා ගත යුතු අතර ත්‍රෛමාසික වාර්තාවක් ගොනුවට ඇතුලත් කල යුතුය.

**9. ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රතිසංශෝධනය හා යලි උපලේඛන ගත කිරීම.**

සෑම ප්‍රාදේශීය ලේකම්වරයකුට මේ වන විට ගෙවන ලබන ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් යලි උපලේඛන ගත කල යුතුය. මේ සඳහා *අබා 03* ආකෘතිය භාවිතා කළ යුතුය. ඒ අනුව පහත පියවර ගත යුතුය.

9.1 සෑම ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමක් සම්බන්ධව උපලේඛන ගත කිරීමේ අයදුම්පත් සම්පූර්ණ කල යුතුය. (*අබා 03* අයදුම්පත යොදාගත හැක)

9.2 එම අයදුම්පත් පරීක්ෂා කොට සුදුසු නිරීක්ෂණ සැපයීමට කමිටුවකට භාර කල යුතුය. මෙම කමිටුව සහකාර ප්‍රාදේශීය ලේකම්/ ගණකාධිකාරී/ පරිපාලන නිලධාරී / විශ්‍රාම වැටුප් නිලධාරී යන නිලධාරීන්ගෙන් කීපදෙනෙකු පත් කල හැක. අවශ්‍ය වෙතොත් ආබාධිතයා හා භාරකරු කැඳවීමට ක්‍රියා කල යුතුය. පරීක්ෂණයට අනුව පූර්ණ ආබාධිත තත්වය නිරූපනය වන්නේ නම් අඛන්ඩව ගෙවීම් සිදු කල යුතුය.

9.3 කමිටු නිර්දේශ පදනම් කරගෙන ප්‍රාදේශීය ලේකම් විසින් ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම අත්හිටුවීමට හෝ යලි වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට යෝජනා කරන්නේ නම් එය මාගේ අනුමැතියට ඉදිරිපත් කල යුතුය.

9.4 ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේදී එම ගෙවීම් හැකිතාක් දුරට තැපැල් කාර්යාල වෙත නිකුත් කල යුතුය.

9.5 කල්ගතවූ ගෙවීම් සඳහා නව විශ්‍රාම වැටුප් හැඳුනුම්පත් නිකුත් කිරීමට පියවර ගත යුතුය.

මෙම චක්‍රලේඛ උපදෙස් කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි.

කේ.ඩී. තිලකරත්න.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

පිටපත් :

1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.
3. විගණකාධිපති

ප්‍රාදේශීය ලේකම්,

...............................................

**නිත්‍ය ආබාධිත දුබලතාවයට පත් අනත්දරුවන් සඳහා වූ**
**<u>ආබාධිත විශ්‍රාම වැටුප ඉල්ලුම් කිරීම.</u>**

නම :- වැන්දඹු අනත්දරු අංකය :-

ඉහත සඳහන් කරුණ පිළිබඳව සළකා බැලීම සඳහා *අබා 01* පෝරමය සමග මාගේ පහත සඳහන් ලියවිලිද ඉදිරිපත් කරමි.

ඉල්ලුම්කරුගේ/ භාරකරුගේ අත්සන

01. ආබාධිතයාගේ උප්පැන්න සහතිකය.
02. මව/ පියාගේ මරණ සහතික මුල් පිටපත්.
03. වර්තමාන රෝගීතාවය පිළිබඳ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි සහතිකය
04. ආබාධිතයාගේ මෑතකදී ලබා ගත් පෝස්ට්කාඩ් ප්‍රමාණයේ සම්පූර්ණ වර්ණ ජායා රූපයක්.
05. පෙර රෝගීතාවය සනාථ කරන සාක්ෂි.
( රෝහල් යන විදි, සායන වාර්තා, රෝග විනිශ්චය තුණ්ඩු )
06. ආබාධිත අනත්දරු දිවුරුම් ප්‍රකාශය.

අයදුම්පත්‍රය

( 1981 අංක 44 දරණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ( සංශෝධන ) පනත හා 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතෙහි විධිවිධාන අනුව ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමට නීතිමය ප්‍රතිපාදන ඇත. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා පනතේ පත්කරන වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඔහු /ඇය ශාරීරික හෝ මානසික අශක්‍යතාවයකින් පෙලෙන බවට තීරණය කලහොත් අනත්දරුවාට වයස පිළිබඳව නොතකා යාවජීව විශ්‍රාම වැටුපක් ප්‍රදානය සලකා බැලීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි වේ. )

සැ . යු . : සම්පූර්ණ කරන ලද අයදුම්පත ග්‍රාම නිලධාරි වෙත භාරදිය යුතුය.

අබා 01

# ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප ඉල්ලීම - ආකෘති පත්‍රය

01. ආබාධිතයාගේ තොරතුරු

I ආබාධිතයාගේ නම :-

II ආබාධිතයාගේ ලිපිනය :-

III ග්‍රාමසේවක කොට්ඨාශය :-

IV ජාතික හැදුනුම්පත් අංකය :-

V උපන් දිනය :-

VI ස්ත්‍රී/ පුරුෂ බව :-

VII විවාහක/ අවිවාහක බව :-

VIII රැකියාව :-

IX ආබාධයේ ස්වභාවය :-

X ආබාධය ඇරඹු දිනය හෝ කාලය :-

XI ආබාධිත වෛද්‍ය වාර්තා පිළිබඳ තොරතුරු :-

XII දැනට යැපෙන්නේ කෙසේද?

XIII දැනට යැපෙන්නේ කවුරුන් යටතේද? :-

XIV දැනට භාරකරුවකු සිටීද? :-
සිටිනම් ලිපිනය හා රැකියාව :-

## 2 පවුලේ තොරතුරු

I වැ.අ.වි.වැටුප් ක්‍රමයේ දායකයාගේ හෝ දායිකාවගේ නම :-

II වැන්දඹු අනත්දරු අංකය :-

III දායකයා අන්තිමට සේවය කල ස්ථානය :-

IV දායකයා මියගිය දිනය :-

V කලත්‍රයාගේ නම :-

VI කලත්‍රයා මියගිය දිනය :-

VII පවුලේ වෙනත් ආබාධිතයන් සිටීද? :-

පවුලේ අනෙකුත් සහෝදර සහෝදරියන් පිළිබඳ තොරතුරු :-

| නම | ලිපිනය | රැකියාව | ආදායම(වාර්ෂික) |
|---|---|---|---|

1 ආබාධිත දරුවා නඩත්තු කිරීමට ඇති බාධාව :-

2 භාරකරුවකු අවශ්‍ය වන්නේද? :-

3 එසේ නම්
ඔහුගේ/ ඇයගේ නම
ජාතික හැඳුනම්පත් අංකය
රැකියාව
ආදායම
ඥාතිත්වය

ඉල්ලුම්කරුගේ අත්සන

( ග්‍රාම නිලධාරි විසින් සම්පූර්ණ කල යුතුය. )

I. ඉහත අයදුම්පතෙහි සඳහන් කරුණු පිළිබඳ නිරීක්ෂණ

II. ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව ග්‍රාම නිලධාරි නිරීක්ෂණ වාර්තාව.

III. භාරකරුවකු පත් කල යුතුද?

IV. භාරකරුවකු අවශ්‍ය නොවන්නේ නම් එයට හේතු .

V. නිර්දේශය :-

ග්‍රාම නිලධාරි ( අත්සන )
(නම සහිත නිලමුද්‍රාව )

අබා 02

## ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේ පරීක්ෂණ වාර්තාව

(අබා 01 අයදුම්පත අනෙකුත් ඇමුණුම් හා පරීක්ෂණ සටහන් වාර්තා සමග ඒකාබද්ධ කල යුතුය.)

I. පරීක්ෂණ වාර්තාව සාරාංශ ගත කරනය

II. කමිටු නිරීක්ෂණ හා නිර්දේශය

කමිටු සාමාජික අත්සන

III. ප්‍රාදේශීය ලේකම් නිර්දේශය

ප්‍රාදේශීය ලේකම්ගේ ( අත්සන )
නම සහිත නිල මුද්‍රාව

අබා 03

# ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රතිසංශෝධනය හා උපලේඛන ගත කිරීම

( දැනට අනත්දරු ආබාධිත විශ්‍රාම වැටුප් ලබාගන්නන් පරීක්ෂා කර ග්‍රාම නිලධාරි විසින් පහත සඳහන් අයදුම්පත්‍රය සම්පූර්ණ කල යුතුය. )

1) ආබාධිත අනත්දරුවා පිළිබඳ තොරතුරු

1.1 ආබාධිතයාගේ නම හා ලිපිනය

1.2 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංකය

හැඳුනුම්පත් අංකය

ගෙවීම් අංකය

බැංකුව, බැංකු ශාඛාව හා ගිණුම් අංකය

ගිණුම් හිමිකරුවන්

තැපැල් කාර්යාලය

1.3 භාරකරුවාගේ නම හා ලිපිනය

2) අබාධිත අනත්දරුවාගේ සමාජීය හා ආර්ථික තත්ත්වය

- විවාහක/ අවිවාහක බව :-
- විවාහක නම් පවුලේ සාමාජික ගණන :-
- පවුලේ ආදායම :-
- භාරකරුගේ නම :-
  - රැකියාව :-
  - පදිංචිය :-

3) ආබාධිත අනත්දරුවාගේ ආබාධිත තත්ත්වය පිළිබඳ නිරීක්ෂණ

4) ආබාධිතයා නිවාස ගත වී ඇත්නම් ඒ පිළිබඳව තොරතුරු

5) භාරකරු පිළිබඳ නිරීක්ෂණ

6) ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගොනුව පිළිබඳ ග්‍රාම නිලධාරී නිරීක්ෂණ

7) කමිටු නිරීක්ෂණ

8) ප්‍රාදේශීය ලේකම්ගේ නිරීක්ෂණ